# හන්තාන කන්ද තරණය කිරීමේ උපදේශ මාලාව

- විශ්ව විද්‍යාල භූමියේ පිහිටි ඉහල හන්තාන සංචාරක බංගලාව ඔස්සේ හන්තාන කන්ද තරණය කිරීමට යන සියලු දෙනා විශ්ව විද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති තුමාගේ ලිඛිත අවසරයක් ලබාගත යුතුය. ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් ශිෂ්‍ය සේවා සහකාර ලේඛකාධිකාරීගෙන් ලබාගත හැක.

- හන්තාන කන්ද තරණය කිරීමට යන සිසුන් ඉහල හන්තාන සංචාරක බංගලාව අසලින් ඉහලට යාම පෙරවරු 9.00 ට පෙර ආරම්භ කල යුතුය.

- කිසිම හේතුවක් නිසා පෙරවරු 9.00 න් පසුව කිසිම කෙනෙකුට හන්තාන කන්ද තරණය කිරීම පිණිස ඉහල හන්තාන සංචාරක බංගලාව අසලින් ඉහලට යාමට ඉඩ දෙනු නොලැබේ.
- හන්තාන කන්ද තරණය කිරීමට පේරාදෙණියේ විශ්ව විද්‍යාලයෙන් ලබාගත් ලිඛිත අවසර පත්‍රය ඉහල හන්තාන සංචාරක බංගලා ආරක්ෂක මුර කපොල්ලට ලබාදිය යුතුය
- ඉහල හන්තාන සංචාරක බංගලාව අසල ඇති ආරක්ෂක මුරපොල වෙත කන්ද තරණය කරන කණ්ඩායමේ වගකිම දරණ පුද්ගලයා විසින් නම, ජාතික හැදුනුම් පත් අංකය, ලිපිනය, ජංගම දුරකථන අංකය, හදිසියකදි දැනුම් දිය යුතු අයගේ විස්තර ලබාදිය යුතුය.
- හන්තාන කන්ද තරණය කරන අය කඳුනැගිමට සුදුසු ඇඳුම් සහ පාවහන් පැළඳිය යුතුය
- අවශ්‍ය තරම් ජලය සහ ආහාර රැගෙන යා යුතුය
- හන්තාන කන්ද තරණය කිරීම අධික වර්ෂ දිනවල නොකල යුතු අතර අන්දිනවලදි වුවත් වැහිකබායන් සහ කුඩ රැගෙන යා යුතුය
- තරණය කිරීම කණ්ඩායමක් වශයෙන් කලයුතු අතර කුමන හේතුවක් නිසාවත් තුදෙකලා නොවිය යුතුය
- හැකි හැමදෙනාම ජංගම දුරකථන රැගෙන යා යුතුය
- හැකිනම් තමන් සිටින ස්ථානය පෙන්නුම් කරනු ලබන Global Positioning System (GPS) විශ්ව ස්ථානිය පද්ධති උපකරණයක් රැගෙන යා යුතුය.
- කඳු මුදුනේ සිට ආපසු තරණය කිරීම පස්වරු 3.00 ට පමණ ආරම්භ කල යුතුය.
- කන්ද තරණය කිරීමේදි තමන්ගේත් තම සගයන්ගේත් ආරක්ෂාව ගැන ඉතාමත් සැලකිලිමත් විය යුතුය.
- ඉහත ආරක්ෂාකාරී පිළිවෙල අනුගමනය නොකර අකරතැබ්බයන්ට පත්වුවහොත් ඔවුන් බේරාගැනීම සඳහ විශ්ව විද්‍යාලයට දැරීමට වන සියලු වියදම් කණ්ඩායම් භාරකරුවාගෙන් අය කිරීමට කටයුතු කරනු ලැබේ.
- කන්ද තරණය කිරීමේදි අකරතැබ්බයක් වි ආධාර උපකාර අවශ්‍ය නම් පහත සඳහන් අංක වලට දැනුම් දෙන්න
  - ක්ෂණික පොලීසිය 119
  - පේරාදෙණිය පොලීසිය 081-238-82222/081-238-8033
  - මහනුවර පොලිසිය 081-222-2222/081-222-2223
  - විශ්ව විද්‍යාල ආරක්ෂක අංශය 081-238-9182
  - පේරාදෙණිය මහ රෝහල 081-238-8001/5
  - මහනුවර මහ රෝහල 081-223-3337, 081-222-2261

මහාචාර්ය ශාන්ත හෙන්නායක
නියෝජ්‍ය උපකුලපති